# <u>ව්‍යාපාර සමාජ වගකීම් හා ආචාරධර්ම</u>

## <u>සමාජ වගකීම්</u>

**"සමස්ථ සමාජයේ සහ ප්‍රාදේශීය ජනතාවගේත්, සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල් වලත් ජීවන තත්වය නංවාලීමට සහ ආර්ථික සංවර්ධනයට දායකවන බවටත්, සදාචාරාත්මකව හැසිරෙන බවටත් ව්‍යාපාර ඇපකැප වීම ව්‍යාපාර සමාජ වගකීමයි"**

**-තිරසාර සංවර්ධනයක් සඳහා වූ ලෝක ව්‍යාපාර කවුන්සිලය-**

**"සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිලිබඳවත්, එමගින් සමාජයට වන බලපෑම පිලිබඳවත් ව්‍යාපාර පෞද්ගලිකවම වගකීම, ව්‍යාපාර වල සමාජ වගකීමයි"**

**-ඇමරිකා එකසත් ජනපදය-**

**"ව්‍යාපාරයක් විසින් සමාජයට ආපසු දෙන දෑ ව්‍යාපාර සමාජ වගකීමයි"**

**-පිලිපීනය-**

<u>සමාජ වගකීම් ඉටුකිරීමෙන් ව්‍යාපාරයකට ලැබෙන ප්‍රතිලාභ</u>

- **ව්‍යාපාරයේ කීර්තිනාමය/ ප්‍රතිරූපය වර්ධනය වීම.**
- **ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සමාජයෙන් සහය ලැබීම.**
- **රජයේ පාලනයන් අවම වීම.**
- **ව්‍යාපාරයේ පැවැත්ම තහවුරුවීම.**
- **ව්‍යාපාරය පිලිබඳ විශ්වසනියත්වය තහවුරුවීම.**
- **ව්‍යාපාරයට හිතකර අංශ අතර අන්තර්රැඳියාව වර්ධනය වීම.**
- **වෙළඳපල පහසුවෙන් ලබා ගත හැකි වීම.**
- **ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ ලඟා කර ගැනීම පහසු වීම.**

<u>සමාජ වගකීම් ඔස්සේ සිදුවන අවාසිදායක තත්වයන්</u>

- **ව්‍යාපාරයේ ලාභ උපරිමනයට බාධාවක් වීම.**
- **අමතර පිරිවැයක් දැරීමට සිදු වීම.**
- **ව්‍යාපාර සමාජයට අනිසි ලෙස බලපෑම් කිරීමට පෙළඹීම.**
- **සමාජ වගකීම් ඉටු නොකරන ව්‍යාපාර සමග තරඟ කිරීම අපහසු වීම.**
- **ව්‍යාපාරයේ කාර්යක්ෂමතාවට බාධාකාරී වීම.**

ව්‍යාපාර සමාජ වගකීම් ඉටුකල යුතු ප්‍රධාන පාර්ශව **4**කි. එනම් <u>අයිතිකරුවන්, සේවකයන්, ගනුදෙනුකරුවන් හා සමාජය</u> යි.

**ව්‍යාපාර සමාජ වගකීම්**

| **අයිතිකරුවන්** | **සේවකයන්** |
|---|---|
| සාදාරණ ඉපැයීමක් ලබා දීම.<br>යෙදූ සම්පත් ආරක්ෂා කිරීම.<br>ආර්ථික ප්‍රතිලාභ අත්කර දීම.<br>අවංකව කළමනාකරණ කටයුතු සිදු කිරීම. | රැකියා සුරක්ෂිතතාවය<br>සමානාත්මතාව<br>සෞඛ්‍ය පහසුකම්<br>මනා වෘත්තිය සම්බන්ධතා<br>මනා සේවක සම්බන්ධතා |
| **ගනුදෙනුකරුවන්** | **සමාජය** |
| සාධාරණ වීම.<br>හානි අවම කිරීම.<br>අයිතීන් ආරක්ෂා කිරීම.<br>ගුණාත්මක භාණ්ඩ/ සේවා සැපයීම.<br>අලෙවියෙන් පසු සේවා. | නිසිපරිදි බදු ගෙවීම.<br>පරිසර හිතකරබව.<br>ආර්ථික වර්ධනයට දායක වීම.<br>සේවා නියුක්තියට දායක වීම.<br>ප්‍රජා සත්කාර සේවා. |

- 21 වන සියවසට පෙර තිබූ කොටස්කරුවන්ට/ අයිතිකරුවන්ට පමණක් ප්‍රතිලාභ අත්කරදීම හෙවත් "කොටස්කරු සංකල්පය" අභිබවා "ඇල්මැති පාර්ශව සංකල්පය" හෙවත් සියලු පාර්ශ්වයන්ට ප්‍රතිලාභ සැලසිය යුතුය යන්න ඉස්මතු වී තිබේ. 21 සියවසයේ සිටම ව්‍යාපාර කොටස්කරුවන්ට එරෙහිව ව්‍යාපාර ක්‍රියාකාරකම් පිලිබඳ ඇල්මැති පාර්ශ්ව කටයුතු කිරීමත් සමග ම මෙය සමාජය තුළ ස්ථාපිත විය. කොටස්කරු සංකල්පයට වඩා ඇල්මැති පාර්ශ්ව සංකල්පය ඔස්සේ සියලු පාර්ශ්වයන් කෙරෙහි අවධානය යොමු වීමත්, එනිසා ව්‍යාපාර කටයුතු සාර්ථකව මෙහෙයවීමට හැකි වීමත් නිසා ව්‍යාපාර වඩාත් මෙම සංකල්පයට අනුගතව ඇත.

- මිහිකත සමුළුව

  "<u>පරිසරය හා සංවර්ධනය පිලිබඳ එකසත් ජාතීන්ගේ සම්මේලනය</u>" හෙවත් මිහිකත සමුළුව 1992 බ්‍රසීලයේ රියෝද ජැනයිරෝ නගරයේදී රටවල් 178 ක සහභාගිත්වයෙන් පැවැත්විණි. මෙහිදී ලෝක පරිසර ගැටළු පිළබඳ සාකච්ඡා කෙරිණි. ලෝක ජල හිගය, වාත දූෂණය අවම කිරීම, විකල්ප බලශක්ති ප්‍රභවයන් ආදී කරුණු පිලිබඳ මෙහිදී වැඩි අවධානය යොමු විය.

- මිහිකත සමුළුවේදී දේශගුණික වෙනස්වීම් සම්බන්ධයෙන් ඇති කරගත් "<u>කියෝතෝ සම්මුතිය</u>" වැදගත් ගිවිසුමකි. කිසියම් භූමියක පරිසරය දූෂණය කරන කිසිවක් නොකිරීම, රටක සංස්කෘතිය විනාශවන ආකාරයේ කිසිදු කටයුත්තක් සිදු නොකිරීම, ජෛව විවධත්වය විනාශවන කිසිවක් නොකිරීම, ස්වභාවික පරිසර කලාප විනාශ කරමින් සිදු කරන මුදල් ඉපයීම් කටයුතු අවම කිරීම ආදිය පිලිබඳ සම්මුති කිහිපයක් මෙහි අන්තර්ගත විය.

තිරසාර සංවර්ධනය

"අනාගත පරම්පරාවට ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාවට බාධාවක් නොවන අයුරින් වත්මන් පරපුරේ අවශ්‍යතා ඉටු කරගනිමින් සිදු කරන සංවර්ධනය තිරසාර සංවර්ධනයයි"

-පරිසරය හා සංවර්ධනය පිලිබඳ ලෝක කොමිසම-

මෙය ප්‍රධාන කොටස් තුනකින් ගොඩනැගී ඇත.

1. ආර්ථික තිරසාර සංවර්ධනය
2. සමාජ තිරසාර සංවර්ධනය
3. පාරිසරික තිරසාර සංවර්ධනය

| | අවධානය යොමු කලයුතු කරුණු | තිරසරබව තහවුරු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග |
|---|---|---|
| **ආර්ථික තිරසාර සංවර්ධනය**<br><br>සම්පත් පරිභෝජනය අඩු කර, ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම මගින් මානව සුභසාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරෙයි. | • ආර්ථික වර්ධනය හා ස්ථායිතාව<br>• ආර්ථික කාර්යක්ෂමතාව<br>• නිෂ්පාදනය හා පරිභෝජනය<br>• සේවා නියුක්තිය<br>• අන්තර්ජාතික වෙළඳාම<br>• තරඟකාරිත්වය | • රැකියා නිර්මාණය<br>• කුසලතා බලගැන්වීම<br>• සම්පත් කාර්යක්ෂමව භාවිතය.<br>• අවදානම් කළමනාකරණය<br>• නවෝත්පාදනය<br>• සේවක සුභසාධනය<br>• පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ අත්කරදීම |
| **සමාජ තිරසාර සංවර්ධනය**<br><br>මිනිස් අවශ්‍යතා සහ වුවමනා සමානව හා සාධාරණව ඉහළ ප්‍රමිතියකින් ලබා කරගැනීමත්, අන් අයගේ එම අයිතිය සුරක්ෂිත කිරීමත් මෙමගින් අපේක්ෂා කරයි. | • ජීවන තත්වය නංවාලීම<br>• සමානාත්මතාව<br>• සමාජ ඒකාග්‍රතාව<br>• ජාත්‍යන්තර සහභාගිත්වය<br>• මානව ප්‍රාග්ධනය නඩත්තු කිරීම<br>• සංස්කෘතික පරිසරය සුරැකීම<br>• දරිද්‍රතාව පිටුදැකීම | • මානව අයිතිවාසිකම් සුරැකීම<br>• සම අවස්ථා සැපයීම<br>• සමාජ සංරක්ෂණ කටයුතු වලට දායක වීම<br>• නීතිය හා සාමය රැකීමට දායක වීම<br>• සමාජ වගකීම් ඉටු කිරීම<br>• මානව විවිධත්වයට ගරු කරමින් කටයුතු කිරීම |
| **පාරිසරික තිරසාර සංවර්ධනය**<br><br>මූලික මිනිස් අවශ්‍යතා වන වාතය, ජලය, ආහාර සහ නිවාස යනාදිය ගුණාත්මකභාවයෙන් පැවතීම හා ඒවා අරක්ෂා කරගනිමින් පවත්වාගෙන යාම මගින් මූලික මිනිස් අවශ්‍යතා සපුරාලීම මෙයින් අපේක්ෂා කෙරෙයි. | • සම්පත් පරිභෝජනය<br>• අපද්‍රව්‍ය කළමනාකරණය<br>• අවදානම් කළමනාකරණය<br>• ස්වභාවික හා සංස්කෘතික හැඩතල | • පරිසර හිතකාමී දෑ මිලට ගැනීම<br>• හරිත නිෂ්පාදනවලට යොමු වීම<br>• අපද්‍රව්‍ය කළමනාකරණය<br>• සම්පත් කාර්යක්ෂමව භාවිතය<br>• පරිසර සංරක්ෂණය.<br>• පරිසර හිතකාමී බලශක්ති ක්‍රම භාවිතය<br>• පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රම භාවිතය<br>• ජෛව විවිධත්වය සුරැකීමට පියවර ගැනීම |

තිරසර බව සඳහා වූ 4R සංකල්පය

**නිෂ්පාදනයේදී, පරිභෝජනයේදී මෙන්ම අපද්‍රව්‍ය කළමනාකරණයේදී 4R සංකල්පය භාවිතය තුළින් තිරසර සංවර්ධනයක් උදා කරගැනීමට ලෝක මට්ටමින් අවධානය යොමු වී ඇත.**

**මේ යටතට අයත් වන්නේ,**

1. **Recycle (ප්‍රතිචක්‍රීකරණය)**

   **මෙහිදී අපද්‍රව්‍ය වෙන්කොට වෙනත් භාණ්ඩයක් නිෂ්පාදනය කල හැකි ද්‍රව්‍යක් බවට පත්කිරීම සිදුවේ. මෙය ප්‍රධාන ආකාර දෙකකට සිදු කරයි.**

   i. **upcycle - අඩු වටිනාකමක් ඇති ද්‍රව්‍ය ඉහළ වටිනාකමක් ඇති ද්‍රව්‍ය බවට පත් කිරීම**

      **උදා: පිදුරුවලින් කඩදාසි නිපදවීම**

   ii. **lowcycle - ඉහල වටිනාකමක් ඇති නිෂ්පාදිත අඩු වටනාකමක් ඇති අමුද්‍රව්‍ය බවට පත් කිරීම**

      **උදා: ඉවත් කරන වාහන, යකඩ බවට පත් කිරීම**

2. **Reuse (නැවත භාවිතය)**

   **නිෂ්පාදන හෝ පරිභෝජන කාර්යයේදී නැවත නැවත භවිතා කල හැකි දෑ යොදා ගැනීම මෙයින් අදහස් වේ.**

   **උදා: Lunch Sheet වෙනුවට Lunch Box භාවිතය**

3. **Reduce (භාවිතය අඩු කිරීම)**

   **පරිසරයට මුදා හරින අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු කිරීම මින් අදහස් කරයි. පරිසරයට අහිතකර දේ භාවිතයෙන් ඉවත් කිරීම, භාවිතය ප්‍රතික්ෂේප කිරීම, භාවිත නොකර සිටීම ආදිය මෙහිදී අවධාරණය කෙරෙයි.**

   **උදාහරණ ලෙස,**

   i. **භාණ්ඩ වල ඇසුරුම් වලට දිරාපත් නොවන පොලිතින් භාවිත නොකිරීම.**

   ii. **පානිය ජල බෝතල් සඳහා ප්ලාස්ටික් බෝතල් යොදා නොගැනීම.**

4. **Replace (නැවත ස්ථාපිත කිරීම)**

   **නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කරන ස්වභාවික සම්පත් වලින් නැවත ස්ථාපිත කල හැකි සම්පත් නැවත ස්ථාපිත කිරීමට කටයුතු කිරීම මේ යටතේ දැක්වේ.**

   **උදා: වනවගා ව්‍යාපෘති**

ව්‍යාපාර කටයුතු වල අහිතකර බලපෑම්

- **වැඩි ලාභ අපේක්ෂාවෙන් ගුණාත්වයෙන් අඩු භාණ්ඩ අපනයනය කිරීම.**
- **පාරිභෝගිකයන් රැවටීම.**
- **සේවක සුභසාධනය නොසලකා හැරීම.**
- **ස්වභාවික සම්පත් අපතේ යන පරිදි නිෂ්පාදන කටයුතු සිදු කිරීම.**
- **පරිසර දූෂණය වන පරිදි අපද්‍රව්‍ය මුදා හැරීම.**
- **සමාජ සංස්කෘතියට නොගැලපෙන වෙළඳ දැන්වීම්, ඇඳුම් මෝස්තර නිර්මාණය කිරීම.**

## ව්‍යාපාර ආචාරධර්ම

**"ව්‍යාපාර විසින් තමාටත්, අන්‍යයන්ටත්, පුළුල් වශයෙන් සමස්ථ සමාජයටත් යහපතක් වන අයුරින් කටයුතු කිරීම හෙවත් හොඳ නරක පිලිබඳ මනා අවබෝධයකින් යුතුව කටයුතු කිරීම ව්‍යාපාර ආචාරධර්ම ලෙස හඳුන්වයි."**

ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීමේ වැදගත්කම

- ගනුදෙනුකරුවන්ගේ විශ්වසනීයත්වය දිනාගත හැකි වීම.
- ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම.
- ව්‍යාපාරය තුළ සිදුවිය හැකි අක්‍රමිකතා, වැරදි සහ වංචා අවම කර ගත හැකි වීම.
- ආයතනයේ කීර්තිනාමය වර්ධනය වීම.
- තරඟකාරිත්වයට සාර්ථකව මුහුණදිය හැකිවීම.

ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

- ව්‍යාපාරය
  ව්‍යාපාරයේ ස්වභාවය, පරිමාණය ආදී සාධක පිලිබඳ සැලකිලිමත් වීම

- අයිතිකරුවන්
  අයිතිකරුවන් කවුද, ඔවුන්ගේ සමාජ සංස්කෘතික පසුබිම, ආකල්ප, ප්‍රතිමාන ආදිය

- සේවකයන්
  සේවකයන් කවුද, ඔවුන්ගේ සමාජ සංස්කෘතික පසුබිම, ආගමික පසුබිම, ආකල්ප, ප්‍රතිමාන, ඔවුන්ගේ අවශ්‍යතා වුවමනා ආදිය

- ගනුදෙනුකරුවන්
  ගනුදෙනුකරුවන්ගේ ස්වභාවය, ඉල්ලුම් රටා, සන්නිවේදනය, ආගමික හා සමාජ පසුබිම ආදිය

- තරගකරුවන්
  තරගකරුවන් සිටීද, ඔවුන් අනුගමනය කරන ආචාරධර්ම මොනවාද ආදිය

- සංවිධාන සංස්කෘතිය
  ආයතනයේ වටිනාකම්, අගනාකම්, සාරධර්ම, සිරිත් විරිත්, ප්‍රතිමාන, චාරිත්‍ර-වාරිත්‍ර ආදිය

- ප්‍රායෝගික බව
  ආචාරධර්ම පද්ධතියක් සකස් කිරීමේදී එය නීතියට එකගද, යථාර්ථවාදීද, ගැටලුකාරී තත්වයක් නොමැතිද, පිරිවැය ආදී කරුණු අනුව එය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කල හැකි වීම

ව්‍යාපාරයක් සඳහා සකස් කරන ලද ආචාරධර්ම ලිඛිතව දැක්වූ විට එය "ආචාරධර්ම සංග්‍රහය" ලෙස හඳුන්වයි. ආචාරධර්ම සංග්‍රහයක් මගින් පහත දෑ අපේක්ෂා කරයි.

- සේවකයින් විසින් එම ආචාරධර්ම වලට අනුකූලව කටයුතු කිරිමට පෙළඹීම
- ආයතනයේ කීර්තිනාමය ඉහළ නංවා ගැනීම.
- පෙර සිදුවූ යල්පැනගිය විෂමාචාර වලක්වා ගැනීම.
- විවිධ ව්‍යාපාර ශ්‍රිතයන් සඳහා ආචාරධර්ම සංග්‍රහ පිළියෙළ කල හැකි වීම.

විවිධ ව්‍යාපාර ශ්‍රිතයන්ට අදාළ ආචාරධර්ම

1. මූල්‍ය අංශයට අදාළ ආචාරධර්ම

   මූල්‍ය වෙළඳපල තුළ සිදුවිය හැකි අක්‍රමිකතා, විනිමය වංචා, කොටස් වෙළඳපල සිදුවිය හැකි වංචා, අනවශ්‍ය ගෙවීම් හා වියදම් ආදී විෂමාචාර පිටු දැකීමට මෙවැනි ආචාරධර්ම ඉවහල් වේ.

2. මානව සම්පත් කළමනාකරණයට අදාළ ආචාරධර්ම
   සේව්‍ය-සේවක සම්බන්ධතා ආශ්‍රිතව පැන නගින අර්බුද වැලක්වීමට අදාළ ආචාරධර්ම මීට ඇතුළත් වෙයි. විශේෂයෙන් සේවක-සේව්‍ය අයිතීන් හා යුතුකම් ආශ්‍රිත ආචාරධර්ම මෙහිදී වැදගත් වෙයි.

3. අලෙවිකරණයට අදාළ අචාරධර්ම
   ව්‍යාපාර අනුගමනය කරන තරඟ විරෝධී චර්යා, අහිතකර මිල උපාය මාර්ග, නොගැලපෙන විකිණුම් හා ප්‍රවර්ධන උපාය මාර්ග ආදිය වළක්වාලීම සඳහා වූ ආචාරධර්ම මීට ඇතුළත් වෙයි.

4. නිෂ්පාදනයට අදාළ ආචාරධර්ම
   නිෂ්පාදන ක්‍රියාවලිය හා නිෂ්පාදිත අනතුරුදායක නොවන ලෙස මෙහෙයුම් කටයුතු සැලසුම් කිරීමට අදාළ ආචාරධර්ම මෙහිදී සලකා බලයි. අනතුරුදායක භාණ්ඩ හා සේවා, පරිසර දූෂණය, කෘතීම ආහාරපාන ආදිය මගින් ඇතිවන අහිතකර තත්ව මගහරවා ගැනීමට මෙම ආචාරධර්ම වැදගත් වෙයි.

5. බුද්ධිමය දේපල වලට අදාළ ආචාරධර්ම
   පේටන්ට් අයිතිය, ප්‍රකාශන අයිතිය, වෙළඳ ලකුණු ආදිය වංචනික ලෙස යොදා ගැනීම, ව්‍යාපාර චරපුරුෂ සේවා පවත්වාගෙන යාම, සේවක දක්ෂතා යටපත් කිරීම යනාදී විෂමාචාර වැලක්වීමට බුද්ධිමය දේපලවලට අදාළ ආචාරධර්ම ඉවහල් වෙයි.

❖ සාධාරණව හා අවංකව තරඟ කිරීම, සත්‍ය දෑ පමණක් සන්නිවේදනය කිරීම, අන් අයට හානි නොකිරීම ආදිය අනුගමනය තුළින් ව්‍යාපාර වලට අචාරධර්මානුකූලව කටයුතු කල හැකිය.

ව්‍යාපාර, ආචාරධර්ම වලට පටහැනිව කටයුතු කරන අවස්ථා

- තරඟකාරී ව්‍යාපාර වල තොරතුරු සොරා ගැනීම.
- ව්‍යාපාරික රහස් සොරා ගැනීම.
- සේවක අයිතීන් සොරා ගැනීම හා සේවක දක්ෂතා යටපත් කිරීම.
- තරඟකරුවන්ගේ සේවකයන්ට අල්ලස් දීම.
- වැරදි තොරතුරු ලබා දීම.
- ආයතනික රහස් භාහිර පාර්ශ්වයන්ට ලබා දීම.
- දුරකථන පණිවිඩ වලට රහසින් සවන් දීම.
- නොමග යවනසුලු පණිවිඩ නිකුත් කිරීම.

A/L NOTE BOOK
All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."